සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department

**අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2014 අගෝස්තු**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2014 ஓகஸ்ற்**
**General Certificate of Education (Adv. Level) Examination, August 2014**

ව්‍යාපාර අධ්‍යයනය I
வணிகக் கல்வி I
Business Studies I

**32 S I**

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය : ..............................

**උපදෙස්:**

- ✻ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- ✻ විභාග අංකය, ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.
- ✻ ප්‍රශ්න අංක **1** සිට **30** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉර මත ලියන්න.
- ✻ ප්‍රශ්න අංක **31** සිට **50** තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉරි මත ලියන්න.
- ✻ සෑම ප්‍රශ්නයකට ම ලකුණු **දෙක** බැගින් හිමි වේ.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංකය | ලකුණු |
| 01 - 30 | |
| 31 - 50 | |
| එකතුව | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අති. ප්‍රධාන පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |

1. පහත සඳහන් ඒවා අතුරෙන් ව්‍යාපාරයක ප්‍රධාන අරමුණක් ලෙස සැලකිය නොහැකි කරුණ කුමක් ද?
   (1) ලාභ උපරිම කිරීම
   (2) වෙළෙඳපොළ කොටස වැඩිකර ගැනීම
   (3) රැකියා අවස්ථා උපරිම කිරීම
   (4) වෙළෙඳපොළේ රැඳී සිටීම
   (5) විකුණුම් උපරිම කර ගැනීම
   (......)

2. විවිධ පාර්ශව ව්‍යාපාර කෙරෙහි උනන්දු වීමට බලපාන හේතූන් කිහිපයක් පහත දැක්වේ.
   A - ලාභය
   B - ව්‍යාපාරික වර්ධනය
   C - වෙළෙඳපොළ කොටස
   D - ගත් තීරණවල සාර්ථකත්වය
   E - වැටුප
   F - රැකියාවේ ස්ථාවරභාවය
   G - උසස්වීම්
   H - තනතුරේ සංවර්ධනය

   ඉහත සඳහන් ඒවා අතුරෙන් කළමනාකරුවන් පමණක් ව්‍යාපාර කෙරෙහි උනන්දුව දක්වන හේතූන් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
   (1) A, B, D, H (2) A, C, D, H (3) A, D, E, H (4) B, D, F, H (5) D, E, F, G
   (......)

3. පහත දැක්වෙන්නේ ව්‍යාපාර කෙරෙහි බලපෑම් කරනු ලබන පාරිසරික බලවේග කිහිපයකි.
   A - ගනුදෙනුකරුවන්
   B - සමාජ සංස්කෘතික සාධක
   C - තරඟකරුවන්
   D - සැපයුම්කරුවන්
   E - ආදේශක භාණ්ඩ නිෂ්පාදකයින්
   F - තාක්ෂණික සාධක

   මේ අතුරෙන් ආසන්න පාරිසරික බලවේග පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
   (1) A, B, C, D (2) A, C, D, E (3) A, C, D, F (4) B, C, D, E (5) B, C, D, F
   (......)

4. ව්‍යාපාරයක් විසින් විවිධ පාර්ශවකරුවන් වෙත ඉටු කළ යුතු සමාජ වගකීම් කිහිපයක් පහත සඳහන් වේ.
   A - සාධාරණ වීම
   B - සමානාත්මතාව
   C - බදු ගෙවීම
   D - ආයෝජනයට සාධාරණ ඉපයීමක්
   E - රැකියා සුරක්ෂිත බව
   F - රැකියා අවකාශ සැලසීම
   G - කාර්යක්ෂම හා අවංක කළමනාකරණය
   H - ප්‍රජා සත්කාර සේවා
   I - අපද්‍රව්‍ය කළමනාකරණය
   J - සෞඛ්‍ය හා ආරක්ෂක පහසුකම්

   මේ අතුරෙන් ව්‍යාපාරයක් විසින් සමාජයට පමණක් ඉටු කළ යුතු සමාජ වගකීම් ඇතුළත් කාණ්ඩය තෝරන්න.
   (1) A, B, E, J (2) A, B, H, J (3) B, C, F, I (4) C, D, G, I (5) C, F, H, I
   (......)

5. පහත වගුවේ **X** තීරුවේ ව්‍යාපාර හා රජයට අයත් කාර්යයන් කිහිපයක් ද, **Y** තීරුවේ එම කාර්යයන්වල ප්‍රතිඵල ද දැක් වේ.

| X | Y |
|---|---|
| A. රජය ව්‍යාපාරවලට බලපෑම් කරන්නේ | 1. ආර්ථිකයේ මුදල් සැපයීම කෙරෙහි ය. |
| B. රජයේ අරමුණු ඉටුකර ගැනීමට ව්‍යාපාර සහාය වන්නේ | 2. තරඟකරුවකු වීමෙනි. |
| C. රජයේ පිස්කල් ප්‍රතිපත්ති ව්‍යාපාරවලට බලපෑම් ඇති කරන්නේ | 3. දේශීය අමුද්‍රව්‍ය භාවිත කිරීමෙනි. |
| D. රජයේ මූල්‍ය ප්‍රතිපත්ති බලපෑම් ඇති කරන්නේ | 4. භාණ්ඩ අලෙවිය වැඩිවීම නිසා ලාභ වැඩිවන හෙයිනි. |
| E. ව්‍යාපාරිකයින්ට පාරිභෝගික ආරක්ෂණය වැදගත් වන්නේ | 5. නිෂ්පාදනයන් මත විවිධ බදු පැනවීම මගින් භාණ්ඩ මිල ඉහළ යාමට සැලැස්වීමෙනි. |

   X හා Y තීරුව නිවැරදි ව ගැළපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?
   (1) A-5, B-2, C-4, D-1, E-3
   (2) A-5, B-3, C-2, D-1, E-4
   (3) A-2, B-3, C-5, D-4, E-1
   (4) A-2, B-3, C-5, D-1, E-4
   (5) A-3, B-2, C-5, D-4, E-1
   (......)

[ දෙවැනි පිටුව බලන්න.

**6.** පහත දැක්වෙන්නේ විවිධ ව්‍යාපාර වර්ගවල වාසි කිහිපයකි.

A - පහසුවෙන් ආරම්භ කළ හැකි වීම
B - විශාල ප්‍රාග්ධනයක් සම්පාදනය කරගත හැකි වීම
C - ස්වාධීන තීරණ ගත හැකි වීම
D - ව්‍යාපාර කළමනාකරණය සඳහා දක්ෂතා ඇති අය බඳවාගත හැකි වීම
E - ව්‍යාපාරය විසුරුවා හැරීම පහසු වීම
F - ලාභය වැඩිදෙනෙකු අතර බෙදාගත හැකි වීම

මේ අතුරෙන් කේවල ස්වාමි ව්‍යාපාරයකින් ලැබෙන වාසි පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) A, C, E (2) A, E, F (3) B, D, E (4) B, D, F (5) C, D, E (......)

**7.** පහත සඳහන් දෑ අතුරෙන් වරලත්තිමියා විසින් වරලත්ලාභියා වෙත සපයනු **නොලබන** පහසුකම කුමක් දැ'යි තෝරන්න.

(1) සිය වෙළෙඳ නාමය භාවිතයට අවසර දීම (2) අලෙවිකරණ සහාය ලබාදීම
(3) මූල්‍ය පහසුකම් ලබාදීම (4) තාක්ෂණ සහාය ලබාදීම
(5) ඕනෑම සැපයුම්කරුවකුගෙන් භාණ්ඩ මිල දී ගැනීමට අවසර දීම (......)

**8.** A - තමන්ගේ හැකියාවන් උපරිම අන්දමට භාවිත කිරීමට ඇති කැමැත්ත
B - සමාජයේ පවත්නා කිසියම් සමාජ ප්‍රශ්නයක් විසඳීම සඳහා දායක වීමට ඇති කැමැත්ත
C - රැකියාවන්ගෙන් ලද අත්දැකීම්
D - ස්ථාවර ආදායමක් ලබා ගැනීමට ඇති කැමැත්ත
E - යම් ක්ෂේත්‍රයක් පිළිබඳ ලබා ඇති අධ්‍යාපනය හා පුහුණුව
F - අවදානම් අවම කර ගැනීමට ඇති කැමැත්ත

ඉහත දෑ අතුරෙන් ව්‍යවසායකයකු බිහිවීමට හේතු විය හැකි කරුණු ඇතුළත් සංයෝජනය තෝරන්න.

(1) A, B, C, D (2) A, B, C, E (3) A, B, D, E (4) B, C, E, F (5) C, D, E, F (......)

**9.** A - ව්‍යවහාර මුදල්
B - බැංකු මුදල්
C - කලු සල්ලි
D - ආසන්න මුදල්
E - විද්‍යුත් මුදල්
F - ණය මුදල්

ඉහත සඳහන් දෑ අතුරෙන් ශ්‍රී ලංකාවේ භාවිත වන මුදල් වර්ග පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) A, B, C හා D (2) A, B, D හා E (3) A, B, D හා F (4) B, C, D හා E (5) C, D, E හා F (......)

**10.** පහත වගුවේ **X** හා **Y** තීරුවල චෙක්පත් ගනුදෙනුවලට අදාළ තොරතුරු කිහිපයක් දැක්වේ.

| X | Y |
|---|---|
| A. වර්ග | 1. අණකරු, අණලද්දා, ආදායකයා |
| B. සම්බන්ධ වන පාර්ශවකරුවන් | 2. සාමාන්‍ය, විශේෂ |
| C. රේඛනය කිරීම | 3. ධාරක, විධාන |

X හා Y තීරුවල දැක්වෙන පද නිවැරදි ව ගළපා ඇති කාණ්ඩය තෝරන්න.

(1) A-1, B-3, C-2 (2) A -3, B-2, C-1 (3) A-2, B-1, C-3
(4) A-3, B-1, C-2 (5) A-1, B-2, C-3 (......)

**11.** පහත සඳහන් ආයතන අතුරෙන් ගිවිසුම්ගත ඉතිරි කිරීම් ආයතනයක් **නොවන්නේ** කුමක් ද?

(1) රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදල (2) සේවක අර්ථසාධක අරමුදල
(3) විශේෂිත කල්බදු සමාගම් (4) රක්ෂණ සමාගම්
(5) සේවක භාරකාර අරමුදල (......)

**12.** උපුල් තම මෝටර් රථය රු. මිලියන 3 කට රක්ෂණය කර ඇත. ඔහුගේ මෝටර් රථය හඳුනා නොගත් පුද්ගලයකු විසින් සොරකම් කරන ලදි. රක්ෂණ සමාගම රු. මිලියන 3 ක් ගෙවා උපුල්ගේ වන්දිය පියවන ලදි. දින කිහිපයකට පසු රක්ෂණ සමාගම විසින් මෝටර් රථය සොයාගනු ලැබූ අතර එය රු. මිලියන 3.5 ක වෙළෙඳපොළ වටිනාකමට වෙන්දේසි කරන ලදි. (වෙන්දේසිකරුගේ ගාස්තුව රුපියල් 150 000 කි). ඉන්පසු රක්ෂණ සමාගම විසින් කළ යුතු වන්නේ,

(1) රු. මිලියන 3 ක් තබාගෙන ඉතිරි මුදල උපුල්ට ලබා දීම ය.
(2) රු. මිලියන 3 සහ වියදම් වූ මුදල තබාගෙන ඉතිරි මුදල උපුල්ට ලබා දීම ය.
(3) වෙන්දේසිකරුගේ වියදම ගෙවා ඉතිරි මුදල තබා ගැනීම ය.
(4) මෝටර් රථය මිල දී ගත් තැනැත්තාට ඉතිරි මුදල ලබාදීම ය.
(5) ඉතිරි මුදල රජයට ගෙවීම ය. (......)

**13.** කොළඹ වරායේ සිට සපුගස්කන්ද තෙල් පිරිපහදු මධ්‍යස්ථානය වෙත ඉන්ධන ප්‍රවාහනය කිරීමට **වඩාත්** සුදුසු පරිවහන මාධ්‍යයන් වන්නේ,

(1) ට්‍රක් රථ, උමං මාර්ග සහ දුම්රිය වේ. (2) නැව්, දුම්රිය සහ ට්‍රක් රථ වේ.
(3) දුම්රිය, නැව් සහ කුඩා අහස් යානා වේ. (4) නල මාර්ග, දුම්රිය සහ බවුසර් වේ.
(5) නල මාර්ග, බවුසර් සහ කුඩා අහස් යානා වේ. (......)

**14.** පහත සඳහන් කරුණු අතුරෙන් ව්‍යාපාර ගෝලීයකරණය කිරීම සඳහා ප්‍රධාන සාධකය වන්නේ කුමක් ද?

(1) යුරෝපා සංගමය (2) තාක්ෂණය
(3) NAFTA වෙළෙඳ ගිවිසුම (4) රටවල්වල ජනවාර්ගික විවිධත්වය වැඩි වීම
(5) වර්ධනය වූ දේශපාලන ස්ථාවරතාව (......)

[ තුන්වෙනි පිටුව බලන්න.

15. සාර්ක් (SAARC) සංවිධානයට අයත් සාමාජික රටවල් පමණක් ඇතුළත් වන්නේ පහත කිනම් කාණ්ඩය තුළ ද?
(1) ඔස්ට්‍රියාව, බෙල්ජියම, නේපාලය, ශ්‍රී ලංකාව සහ ලිතුවේනියාව
(2) නෙදර්ලන්තය, පෘතුගාලය, භූතානය, ශ්‍රී ලංකාව සහ ඉන්දියාව
(3) එක්සත් රාජධානිය, රුමේනියාව, ඇෆ්ගනිස්ථානය, ශ්‍රී ලංකාව සහ පකිස්තානය
(4) ඉන්දියාව, ශ්‍රී ලංකාව, ඇෆ්ගනිස්ථානය, පකිස්තානය සහ බංග්ලාදේශය
(5) ග්‍රීසිය, ප්‍රංශය, අයර්ලන්තය, ඉතාලිය සහ භූතානය (......)

16. බලතල (අධිකාරිය) පැවරීම තුළින් ඇති **නොවන** ප්‍රතිඵලය දැක්වෙන ප්‍රකාශය තෝරන්න.
(1) ආසන්නතම ප්‍රධානියාගේ වැඩ ප්‍රමාණය අඩුවීම
(2) ආසන්නතම ප්‍රධානියාගේ පුහුණුව හා සංවර්ධනය වැඩි වීම
(3) යටත් සේවකයන්ගේ වැඩ ප්‍රමාණය අඩු වීම
(4) අභිප්‍රේරණය වූ සේවකයින් ඇති වීම
(5) වෘත්තීය සංවර්ධනයට යටත් සේවකයා සූදානම් කිරීම (......)

17. සැලසුම් කිරීමේ දී සැලකිල්ලට ගත යුතු දෑ මොනවා දැ'යි විමසන ලද ප්‍රශ්නයට ශිෂ්‍යයින් කිහිපදෙනෙකු සැපයූ පිළිතුරු පහත පරිදි වේ.
A - ප්‍රායෝගික බව
B - නම්‍යශීලී බව
C - අවස්ථානුකූල සැලසුම් කිරීම
D - නිශ්චිත කාල පරාසයක් සඳහා වීම
E - සම්පත් ලබා ගත හැකි බව
ඉහත කරුණුවලින්, සැලසුම් කිරීමේ දී සැලකිල්ලට ගත යුතු දැ වන්නේ,
(1) A පමණකි. (2) A හා B පමණකි. (3) A, B හා C පමණකි.
(4) A, B, C හා D පමණකි. (5) ඉහත සඳහන් සියලු ම කරුණු ය. (......)

18. පහත සඳහන් පුද්ගලයින් අතුරෙන් කළමනාකරණ කුසලතා හඳුන්වා දුන් පුද්ගලයා කවුරුන් ද?
(1) ඇඩම් ස්මිත් (2) හෙන්රි ෆෝර්ඩ් (3) හෙන්රි මින්ට්ස්බර්ග්
(4) රොබර්ට් එල්. කාට්ස් (5) එෆ්. ඩබ්ලිව්. ටේලර් (......)

19. පහත සඳහන් කරුණුවලින් නිෂ්පාදන ක්‍රියාවලි තීරණවලට බලපෑමක් ඇති **නොකරන** සාධකය වන්නේ,
(1) සේවකයන්ගේ පුහුණු හා නුපුහුණු බව (2) අවශ්‍ය උපකරණ වර්ග
(3) නිපදවිය හැකි නිෂ්පාදන වර්ග (4) සංවිධානය සතු වාහන ප්‍රමාණය
(5) භාවිත කිරීමට සිදුවන මෙහෙයුම් පිරියත සැලසුම් වර්ග (......)

20. පරිගණක ආධාරක නිර්මාණකරණය (CAD) නිසා ඇති **නොවන** වාසිය කුමක් ද?
(1) අපතය අඩුවීම (2) ශූන්‍ය දෝෂ නිෂ්පාදිත බිහිවීම
(3) නිෂ්පාදනය වේගවත් වීම (4) සේව්‍ය-සේවක සම්බන්ධතා වර්ධනය වීම
(5) ඵලදායිතාව වර්ධනය වීම (......)

21. පහත සඳහන් දෑ අතුරෙන් වෙළෙඳ දැන්වීමක සඵලදායිතාව දැන ගැනීමට අලෙවි කළමනාකරුවකු සඳහා වඩා වැදගත් වන තොරතුරු මූලාශ්‍රය කුමක් ද?
(1) අලෙවි දත්ත (2) අලෙවිකරණ ජාලය
(3) වෙළෙඳපොළ පර්යේෂණ (4) අභ්‍යන්තර දත්ත සමුදාය (Internal database)
(5) තරගකරුවන්ගේ ප්‍රතිපෝෂණය (......)

22. පහත සඳහන් දෑ අතුරෙන් දිගුකාලීන් අරමුදල් සම්පාදන මාර්ගයක් වන්නේ කුමක් ද?
(1) වෙළෙඳ ණය (2) බැංකු අයිරා (3) කොටස් නිකුතුව
(4) ගෙවිය යුතු වියදම් කල්දැමීම (5) සේවක දිරිගැන්වීම සඳහා කොටස් නිකුතුව (......)

23. සංවිධානයක මූල්‍ය කළමනාකරණයේ ප්‍රධාන ඊරමාර්ථය වන්නේ,
(1) ආයතනය විසින් සපයනු ලබන නිෂ්පාදන හෝ සේවාවන්ගේ වර්ගය හා ප්‍රමාණය වැඩි කිරීම ය.
(2) ආයතනය විසින් ගෙවනු ලබන බදු ප්‍රමාණය අවම කිරීම ය.
(3) අයිතිකරුවන්ගේ ව්‍යාපාරය හා සබැඳි අගය (ධනය) උපරිම කිරීම ය.
(4) සේවකයන් විසින් උපයනු ලබනු ප්‍රතිදාන උපරිම කිරීම ය.
(5) ගනුදෙනුකරුවන්ගේ තෘප්තිය උපරිම කිරීම ය. (......)

24. රඳවාගත් ඉපැයුම් (Retained earnings) යනුවෙන් අදහස් වන්නේ,
(1) ලාභාංශ ගෙවීමෙන් පසු ආයතනයේ ඉතිරි වූ සමස්ථ ඉපැයුම් වටිනාකමයි.
(2) සමාගමේ ද්‍රවශීලතාවය පිළිබඳ සංඥාවකි.
(3) බැංකුවේ ඇති මුදල් ශේෂය හා සමාන දෙයකි.
(4) ආයතනය වෙළෙඳාමෙන් ඉපැයූ ලාභය වේ.
(5) ව්‍යාපාරයේ වියදම් හා පිරිවැය අඩු කළ පසුව සමාගමේ ඉතිරිවන සමස්ථ ලාභය වේ. (......)

25. අයදුම්කරුවන්ගේ සුදුසුකම් හා කුසලතා හඳුනා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂකවරුන් විසින් නියමානුකූල ව සකස් කර ගන්නා ප්‍රශ්න හඳුන්වන්නේ,
(1) රැකියා විස්තර ප්‍රශ්නාවලිය ලෙස ය. (2) රැකියා පිරිවිතර ප්‍රශ්නාවලිය ලෙස ය.
(3) කුසලතා පරීක්ෂණ ප්‍රශ්නාවලිය ලෙස ය. (4) ව්‍යුහගත ප්‍රශ්නාවලිය ලෙස ය.
(5) රැකියා විශ්ලේෂණ ප්‍රශ්නාවලිය ලෙස ය. (......)

**26.** අභ්‍යන්තර සේවක ආකර්ෂණය තුළින් ලබාගත හැකි වාසියක් වන්නේ,
(1) නව දැනුම සහිත පුද්ගලයින් ආකර්ෂණය කර ගැනීමට හැකි වීමයි.
(2) සේවකයන් අතර අනවශ්‍යය තරගයක් ඇති වීමයි.
(3) විශාල අයදුම්කරුවන් සංඛ්‍යාවක් ආකර්ෂණය කරගත හැකි වීමයි.
(4) සේවකයන්ගේ ලැදියාව වැඩි වීමයි.
(5) ආකර්ෂණය කර ගැනීමේ වියදම වැඩි වීමයි. (……)

**27.** පහත සඳහන් ද ඇතුරෙන් ප්‍රාදේශීය ක්ෂේත්‍ර ජාලය (LAN) නිවැරදි ව විස්තර කෙරෙන පිළිතුර වන්නේ,
(1) විවිධ භූගෝලීය ප්‍රදේශවල ඇති පරිගණක සම්බන්ධ කිරීම ය.
(2) එකම ගොඩනැගිල්ලක් තුළ ඇති පරිගණක අන්‍යොන්‍ය වශයෙන් සම්බන්ධ කිරීම ය.
(3) එකම කාර්යාලයේ ඇති මුද්‍රණ යන්ත්‍රයට පරිගණකය සම්බන්ධ කිරීම ය.
(4) රටවල් කිහිපයක ස්ථාපිත කර ඇති පරිගණක අන්තර්ජාලය හරහා සම්බන්ධ කිරීම ය.
(5) ඉහත සඳහන් කිසිවක් නොවේ. (……)

**28.** පාඨ කථන (Text chatting) සඳහා මූලික අවශ්‍යතාවයක් වන්නේ,
(1) වෙබ් කැමරාවයි (Web camera). (2) යතුරු පුවරුවයි (Keyboard). (3) මවුසයයි (Mouse).
(4) මයික්‍රෆෝනයයි (Microphone). (5) USB ෆ්ලෑෂ් ධාවකයයි (USB Flash drive). (……)

**29.** පහත දැක්වෙන පාර්ශව අතුරෙන් මනාව සකස් කරන ලද ව්‍යාපාර සැලැස්මක් භාවිත **නොකරන** පාර්ශවය කුමක් ද?
(1) ව්‍යවසායකයින් (2) කළමනාකරුවන් (3) ආයෝජකයින්
(4) සැපයුම්කරුවන් (5) ප්‍රචාරණ ආයතන (……)

**30.** ව්‍යාපාර සැලැස්මක ඇති 'ව්‍යාපාර විස්තරය' යන අයිතමයේ ඇතුළත් **නොවන** ප්‍රධාන අංගයක් වන්නේ කුමක් ද?
(1) අධ්‍යක්ෂ මණ්ඩලයේ විස්තරය (2) ව්‍යාපාරයේ නම හා ලිපිනය (3) විධායක සාරාංශය
(4) සංවිධාන ව්‍යුහය (5) ව්‍යාපාරයේ අරමුණු (……)

- අංක 31 සිට 40 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී **සුදුසු වචන** යොදා හිස්තැන් පුරවන්න.

**31.** (අ) ව්‍යාපාර වර්ග හා ව්‍යාපාර වර්ගීකරණ නිර්ණායක සම්බන්ධ දැනුම භාවිත කර පහත වගුව සම්පූර්ණ කරන්න.

| විස්තරය | අයිතිය | අරමුණ |
|---|---|---|
| 1. සේවකයින් දෙදෙනෙකු සේවයේ යෙදී සිටින මැහුම් සාප්පුවක් | පුද්ගලික | ………………… |
| 2. වාණිජ බැංකුවක් | ………………… | ලාභය |
| 3. ඇඳන් 50 කින් සමන්විත සමූපකාර ආරෝග්‍ය ශාලාවක් | ………………… | ………………… |

(ආ) ………………………… හා ………………………… හමුවන සහ සම්බන්ධතා පවත්වන ඕනෑම ආකාරයක් වෙළෙඳපොළකි.

**32.** (අ) පහතින් ඔබට සපයා ඇත්තේ පලතුරු යුෂ බෝතල්කරණය කරනු ලබන නිෂ්පාදන ආයතනයකට අදාළ තොරතුරු කිහිපයකි.
බෝතල්වලට පලතුරු යුෂ පිරවීම, පලතුරු, සේවකයින් පුහුණු කිරීම, ප්‍රචාරණය, නව යන්ත්‍රයකට ආයෝජනය කිරීම.
ඉහත තොරතුරු පදනම් කරගෙන පහත දැක්වෙන වගුවේ හිස්තැන් පුරවන්න.

| යෙදවුම් | ව්‍යාපාර ක්‍රියාවලිය | නිමැවුම් |
|---|---|---|
| ………………… | නිෂ්පාදන :-…………………………<br>අලෙවිකරණ :-…………………………<br>මානව සම්පත් :-…………………………<br>මූල්‍ය :- නව යන්ත්‍රයකට ආයෝජනය කිරීම | පලතුරු යුෂ පිරවූ බෝතල් |

(ආ) වර්ෂයක් තුළ රටක සමස්ථ නිෂ්පාදන හා සේවාවන්ගේ මුළු වටිනාකම ………………………… වේ.

**33.** (අ) ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ ව්‍යාපාර දිරිගැන්වීම සඳහා සේවා සපයනු ලබන ආයතන අතුරෙන් I D B යන කෙටි යෙදුමෙන් හඳුන්වනු ලබන ආයතනය ………………………… වන අතර S L B D C කෙටි යෙදුමෙන් හඳුන්වනු ලබන්නේ ………………………… යන ආයතනය වේ.

(ආ) 1. ………………… 2. ………………… 3. …………………
4. ………………… ව්‍යවසායකත්ව නිපුණතා (Competencies) කිහිපයක් ලෙස දැක්විය හැක.

34. (අ) ශ්‍රී ලංකාවේ විශේෂිත මූල්‍ය ආයතන **දෙකක්** ලෙස .......................................... සහ..........................
.............................. හැඳින්විය හැක.

(ආ) සිය ගනුදෙනුකරුවන්ගේ වටිනා භාණ්ඩ හා වැදගත් ලියකියවිලි ආරක්ෂා කරදීම සඳහා වාණිජ බැංකුවක් විසින් පවත්වාගෙන යනු ලබන සේවාව .......................................... ලෙස හඳුන්වයි.

35. (අ) .............................. සහ .............................. යනු සඵලදායී පණිවුඩයක් සකස් කිරීමේ දී සැලකිය යුතු සාධක **දෙකකි.**

(ආ) ආයතනයක මාසික ප්‍රගති සමාලෝචන රැස්වීමේ දී ආයතනයේ ප්‍රධාන විධායක නිලධාරී විසින් සෙසු කළමනාකරුවන් ඇමතීම .............................. මෙන්ම .............................. සන්නිවේදන ක්‍රමයකි.

36. (අ) ව්‍යාපාර ගනුදෙනුවල දී විද්‍යුත් වෙළෙඳාම සිදු විය හැකි ආකාර **දෙකක්** ලෙස ..............................
සහ .............................. දැක්විය හැක.

(ආ) කිසියම් ප්‍රධානියකුගේ අධිකාරී බලය පැවරීම මත යම් කාර්යයක නිරත වන්නා හඳුන්වන්නේ.............................. ලෙස ය.

37. (අ) සාකල්‍යවාදී අලෙවිකරණ සංකල්පයේ කොටස් **දෙකක්** ලෙස .............................. සහ
.............................. හැඳින්විය හැක.

(ආ) භාණ්ඩයක් මිල කිරීමේ අරමුණු **දෙකක්** වන්නේ, .............................. සහ. .............................. ය.

38. (අ) .............................. සහ .............................. යනු සම්බන්ධතා අලෙවිකරණය (Relationship marketing) සම්පූර්ණ කිරීමට අත්‍යවශ්‍යයෙන් සපුරාලිය යුතු ගුණාංග **දෙකකි.**

(ආ) අතරමැදියකු නොමැති ව භාණ්ඩ බෙදා හැරීම .............................. වේ.

39. (අ) ..............................සහ .............................. නූතන හුවමාරු ක්‍රියාවලියට සහාය වන විවිධ සේවාවන් අතුරෙන් සේවාවන් **දෙකකි.**

(ආ) ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සිය ව්‍යාපාර සන්නම් .............................. දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුත්තේ.............................. පනත යටතේ ය.

40. (අ) USB ෆ්ලෑෂ් ධාවකයේ වාසි **දෙකක්** වන්නේ .............................. සහ .............................. ය.

(ආ) මධ්‍යම මට්ටමේ කළමනාකරුවන්ට සැලසුම් හා පාලන කටයුතු සඳහා අවශ්‍ය තොරතුරු සපයන පද්ධතිය හඳුන්වනු ලබන්නේ .............................. නමිනි.

- අංක **41** සිට **50** තෙක් ප්‍රශ්නවලට **නිශ්චිත පිළිතුරු** සපයන්න.

41. ව්‍යාපාරික පරිසරය අවබෝධ කර ගැනීම සැලසුම්කරණයට ඉතා වැදගත් ය. පහත සඳහන් ප්‍රකාශ ඉදිරියෙන් ඇති හිස්තැන් SWOT ආකෘතියේ දක්නට ලැබෙන ශක්තීන්, දුර්වලතා, අවස්ථා හා තර්ජන යන යෙදුම්වලින් සුදුසු යෙදුම භාවිත කර සම්පූර්ණ කරන්න.

1. ව්‍යාපාර කටයුතු සඳහා ශ්‍රී ලංකාවේ උතුරු හා නැගෙනහිර පළාත් විවෘත වීම ..............................
2. ඔබගේ ව්‍යාපාරය පිහිටි ප්‍රදේශය තුළ නව ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීම සඳහා බොහෝ ආයතන සැලසුම් කිරීම : ..............................
3. නව වෙළෙඳපොළවල් සඳහා ව්‍යාපාර කටයුතු පුළුල් කිරීමට අවශ්‍ය වන දක්ෂතා ඇති සේවකයින් ආයතනය තුළ නොමැති වීම : ..............................
4. ශක්තිමත් ලෙස ස්ථාපිත වී ඇති සමාගමේ භාණ්ඩ සන්නම : ..............................

42. පාරිභෝගික අයිතිවාසිකම් **හතරක්** ලියන්න.

1. ..............................
2. ..............................
3. ..............................
4. ..............................

43. පිළිගත් සමුපකාර ප්‍රතිපත්ති **හතරක්** ලියන්න.

1. ..............................
2. ..............................
3. ..............................
4. ..............................


**44.** (අ) අගයක් ලබා දෙන කිසියම් දෙයක් කිරීම සඳහා අවදානම් දැරීමට කැමති පුද්ගලයකුට ..............................
කියනු ලබන අතර, දැනට කරගෙන යනු ලබන ව්‍යාපාරයක සේවය කරමින් නව සොයාගැනීම් හඳුන්වා දෙමින් වෙනස්කම්
ඇති කරන තැනැත්තාට ........................................ කියනු ලැබේ.

(ආ) අපනයන සංවර්ධන මණ්ඩලය මගින් කුඩා ව්‍යාපාර සඳහා ලබාදෙන දිරි ගැන්වීම්........................................
සහ ........................................ විශයෙන් දැක්විය හැක.

**45.** හෙන්රි මින්ට්ස්බර්ග් (Henry Mintzberg) විසින් ඉදිරිපත් කළ අන්තර් පුද්ගල භූමිකාවට අයත් උපභූමිකා **දෙකක්** නම් කරන්න.

1 ........................................ 2 ........................................

**46.** ව්‍යාපාරයක මූල්‍ය සම්පාදන මාර්ග පිළිබඳ දැක්වෙන පහත සටහන සම්පූර්ණ කරන්න.




**47.** (අ) ව්‍යවසායකයකු තම භාණ්ඩ හෝ සේවා අලෙවි කිරීමට අපේක්ෂා කරනු ලබන පාරිභෝගික කණ්ඩායම ..................
........................................ නමින් හඳුන්වයි.

(ආ) විනෝදාංශ ලෙස කරනු ලබන කටයුතු ව්‍යාපාරයක් බවට පත්වීම පිළිබඳ ව එක් උදාහරණයක් වන්නේ..............
........................................................................ ය.

**48.** පහත ඇති හිස්තැන් සුදුසු පද යොදා සම්පූර්ණ කරන්න.

1. මුළු විකුණුම් ආදායම (–) .............................. = දළ ලාභය
2. දළ ලාභය (+) වෙනත් ආදායම් (–) .............................. = මෙහෙයුම් වියදම්
3. .............................. (–) වගකීම් = හිමිකම් ප්‍රාග්ධනය
4. ශුද්ධ ආදායම (÷) හිමිකම් ප්‍රාග්ධනය = ..............................

**49.** රක්ෂණ ව්‍යාපාරයේ සඵලදායීතාවයට රක්ෂණ මූලධර්ම වැදගත් වේ. එම රක්ෂණ මූලධර්ම **හතරක්** ලියන්න.

1. ........................................ 2. ........................................
3. ........................................ 4. ........................................

**50.** (අ) සේවක වැඩ වර්ජන වර්ග **දෙකක්** නම් කරන්න.

1. ........................................ 2. ........................................

(ආ) ආයතනයේ ඉතා සුළු නීති රීති පවා අනුගමනය කරමින් ඉතා සුළු වැඩ ප්‍රමාණයක් සිදු කිරීම ..............................
........................ වන අතර මේ නිසා ආයතනයේ ........................................ වැඩි වේ.

* * *

70670

AL/2014/32/S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2014 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2014 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2014

ව්‍යාපාර අධ්‍යයනය II
வணிகக் கல்வி II
Business Studies II

32 S II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

උපදෙස්:

✳ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## I කොටස

1. (i) සමාජය තුළ ව්‍යාපාර විසින් වැදගත් භූමිකාවන් කිහිපයක් ඉටු කරනු ලැබේ.
   (අ) කාර්මික විප්ලවය හේතු කොටගෙන ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඇති වූ ප්‍රධාන වෙනස්කම් කෙටියෙන් විස්තර කරන්න.
   (ආ) ව්‍යාපාර විසින් සම්පූර්ණ කරනු ලබන විවිධ පුද්ගල අවශ්‍යතා මොනවා ද? (ලකුණු 04 යි)

   (ii) ශ්‍රී ලංකාවේ පැරණි ආර්ථික ක්‍රියාවලිය තුළ කෘෂිකර්මාන්තය මූලික වුව ද, වර්තමානයේ කෘෂිකර්මාන්තයට අමතර ව විවිධ වූ අංශ වෙත නැඹුරුවීමක් දක්නට ලැබේ.
   (අ) මෙම වත්මන් ප්‍රවණතාව සඳහා බලපාන හේතු **හතරක්** සඳහන් කරන්න.
   (ආ) 'වාණිජ්‍ය' හා 'ව්‍යාපාර' අතර ඇති සම්බන්ධතාවය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

   (iii) පහත දැක්වෙන සංකල්ප යුගල අතර සමාන අසමානකම් විමසන්න.
   (අ) වෙළෙඳපොළ ස්ථානය (market place) හා වෙළෙඳපොළ අවකාශය (market space)
   (ආ) කල්පවතින භාණ්ඩ හා පහසු භාණ්ඩ (ලකුණු 04 යි)

   (iv) ක්ෂණික ආහාර ව්‍යාපාරය (Fast-food business) ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශයන්හි ඉතා සීඝ්‍රයෙන් වර්ධනය වේ.
   (අ) ක්ෂණික ආහාර ව්‍යාපාරයේ සීඝ්‍ර වර්ධනයට බලපාන සාර්ව පාරිසරික සාධක මොනවා ද?
   (ආ) ක්ෂණික ආහාර ව්‍යාපාරය තුළ තම ගනුදෙනුකරුවන් ආකර්ශනය කර ගැනීම හා රඳවා ගැනීම කෙරෙහි හිතකර ලෙස බලපාන අභ්‍යන්තර පාරිසරික සාධක කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

   (v) (අ) ව්‍යාපාර ක්ෂේත්‍රයේ ඇතැම් අංශවල ව්‍යාප්තියත් සමඟ සිදුවන ව්‍යාපාර ක්‍රියාකාරකම් මගින් සමාජයට හා ව්‍යාපාර කෙරෙහි ඇල්මක් දක්වන පාර්ශවවලට අහිතකර බලපෑම් ඇති වේ. එසේ අහිතකර බලපෑම් ඇති කරමින් ව්‍යාප්ත වන අංශ මොනවා ද'යි කෙටියෙන් විස්තර කරන්න.
   (ආ) ව්‍යාපාර ආචාරධර්ම පිළිපැදීම ආයතනයකට වැදගත් වන්නේ ඇයි ද'යි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
   (මුළු ලකුණු 20 යි)

2. (i) (අ) නිදහස් වෙළෙඳ කලාපයේ ආයෝජකයින් සඳහා ශ්‍රී ලංකා රජය විසින් ලබාදෙන පහසුකම් මොනවා ද?
   (ආ) ශ්‍රී ලංකා රජය විසින් මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ දී යොදාගන්නා උපකරණ **හතරක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04 යි)

   (ii) (අ) වත්මන් සමාජය තුළ සමූපකාර සමිති එතරම් ප්‍රචලිත නොවන්නේ ඇයි ද'යි විස්තර කරන්න.
   (ආ) හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන්ගේ අයිතීන් **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

   (iii) විදේශයක සේවා නියුක්තව සිටි කමල්, රුපියල් මිලියනයක තැන්පත් මුදලක් ද සහිත ව ශ්‍රී ලංකාවට පැමිණියේ ය. මේ වන විට ඔහු එම මුදලින් තමන්ගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අපේක්ෂාවෙන් සිටී. නමුත් ඔහුගේ ඇතැම් මිතුරන් උපදෙස් දෙන්නේ මෙම මුදලින් හවුල් ව්‍යාපාරයක් ආරම්භ කරන ලෙස ය.
   ඉහත දැක්වෙන තෝරාගැනීම් දෙකෙහි ම වාසි හා අවාසි දක්වමින් කමල් විසින් ගත යුතු වඩාත් සුදුසු තීරණය කුමක් ද'යි පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

   (iv) (අ) රජයක් විසින් ව්‍යාපාර සඳහා බලපෑම් කළ හැකි ආකාර **හතරක්** සඳහන් කරන්න.
   (ආ) සමාගමක් සංස්ථාපනය කිරීමේ දී සමාගම් රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ලියකියවිලි මොනවාද? (ලකුණු 04 යි)

   (v) (අ) අක්වෙරළ සමාගම් හා විදේශීය සමාගම් අතර ඇති සමානකම් හා අසමානකම් **දෙක** බැගින් සඳහන් කරන්න.
   (ආ) පාරිභෝගිකයන් ආරක්ෂා කිරීම සඳහා පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සතු බලතල **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
   (මුළු ලකුණු 20 යි)

[ දෙවැනි පිටුව බලන්න

3. (i) (අ) කුඩා ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ දී සැලකිලිමත් විය යුතු කරුණු මොනවා ද?
(ආ) පහත දැක්වෙන තොරතුරු ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
සාර්ථක ව්‍යවසායකයකු වීමේ සිහිනයෙන් පෙලුනු සිරිමල් වයස අවුරුදු 20 දී රු. 50 000 ක් ආයෝජනය කරමින් අයිස්ක්‍රීම් ව්‍යාපාරයට අවතීර්ණ විය. මේ වන විට ඔහු මෙම ව්‍යාපාරයට අවශ්‍ය පුහුණුව හා අත්දැකීම්වලින් යුක්ත අතර 5% ක වෙළෙඳපොළ කොටසක් අත්පත් කරගෙන සිටියි. ඔහුට අනුව, ඔහුගේ ව්‍යාපාරික නව්‍යකරණයන් සහ පවුලේ සාමාජිකයින් හා මිතුරන් සමග එක්ව ගොඩනගා ගත් සම්බන්ධතා ජාලය වර්තමානයේ ඔහු සිටින සාර්ථකත්වයට හේතු වී ඇත. මේ වන විට ඔහුගේ ව්‍යාපාරය තව දුරටත් පුළුල් කළ යුතු දැ'යි ඔහු විසින් සැලකිල්ලට ගනිමින් සිටියි.
1. තම ව්‍යාපාරය තවදුරටත් සාර්ථක කර ගැනීම සඳහා සිරිමල් විසින් ඇති කර ගත යුතු ව්‍යවසායකත්ව නිපුණතා මොනවා ද?
2. තම ව්‍යාපාරයේ සාර්ථකත්වය ලඟා කර ගැනීම සඳහා සිරිමල් විසින් ගත යුතු ඊලඟ උපාය මාර්ගය වශයෙන් ඔබ යෝජනා කරන්නේ කුමක් ද? (ලකුණු 04 යි)

(ii) (අ) බැංකු මුදල් හා විද්‍යුත් මුදල් අතර ඇති වෙනස්කම් මොනවා දැ'යි උදාහරණ සහිත ව කෙටියෙන් පැහැදිලි කරන්න.
(ආ) මූල්‍ය අවශ්‍යතා පිළිබඳ සේවාවන් ඉටු කිරීම සඳහා රාජ්‍ය හා පෞද්ගලික බැංකු ආයතන පැවතිය ද, වෙනත් මූල්‍ය ආයතන මගින් ද විශාල වශයෙන් එම සේවා සැපයීම සිදු කරනු ලබයි.
1. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විවිධ මූල්‍ය ආයතන වර්ග මොනවා ද?
2. බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට නියැලීමට අවසර ලබා දී **නොමැති** ව්‍යාපාරික කාර්යයන් මොනවා ද? (ලකුණු 04 යි)

(iii) (අ) කල්බදු සමාගම්වලින් ව්‍යාපාරවලට ලැබෙන ප්‍රයෝජන මොනවා ද?
(ආ) ව්‍යවසායකයින් සඳහා ව්‍යවසායක ප්‍රාග්ධන සමාගමක් (Venture Capital Company) විසින් සපයනු ලබන සේවා සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) ඇතැම් පුද්ගලයින් විසින් ණය කාඩ්පත් (Credit cards) භාවිත කිරීම සඳහා මැලිකමක් දක්වන්නේ ඇයි දැ'යි පැහැදිලි කරන්න.
(ආ) වාණිජ බැංකුවක ජංගම ගිණුමක් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාරිකයකුට බැංකු අයිරා පහසුකම හැර ලබාගත හැකි වෙනත් පහසුකම් මොනවා ද? (ලකුණු 04 යි)

(v) (අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු සඳහන් කරන්න.
(ආ) තම පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා වාණිජ බැංකු විවිධ කාර්යයන්හි නියුක්ත වේ.
1. වාණිජ බැංකු, තම අරමුණු ඉටුකර ගැනීම සඳහා යොදා ගන්නා ප්‍රධාන කාර්යයන් සඳහන් කරන්න.
2. ව්‍යාපාර සංවර්ධනය සඳහා මූල්‍ය ආයතන කෙසේ දායක වන්නේ දැ'යි කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

4. (i) සම්පත්ගේ මෝටර් රථය අනතුරකට ලක් වීමෙන් සිදු වූ අලාභය රු. 1 200 000 ක් ලෙස තක්සේරු කර ඇත. මෙම මෝටර් රථය රු. 2 000 000 ක් වටිනා අතර, එය රු. 1 800 000 කට 'SRC' රක්ෂණ සමාගමේ සහ රු. 1 200 000 කට 'JSA' රක්ෂණ සමාගමේ රක්ෂණය කර ඇත.
(අ) වාහනයේ සම්පූර්ණ අලාභය රක්ෂණ සමාගම් දෙකෙන් ම ලබාගත හැකි ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න.
(ආ) ප්‍රතිරක්ෂණය (underwriting) හා ප්‍රාරක්ෂණය (re-insurance) ලෙස හඳුන්වන්නේ කුමක් ද? (ලකුණු 04 යි)

(ii) එළවළු හා පලතුරු ප්‍රවාහනය කිරීමේ දී දුම්රිය හා මහාමාර්ග ප්‍රවාහනය යොදා ගැනීම මගින් ඇති විය හැකි වාසි හා අවාසි සංසන්දනය කරන්න. (ලකුණු 04 යි)

(iii) ඇඟලුම් කම්හලක ප්‍රධාන කාර්මික ශිල්පියා විසින් ඔහු යටතේ සේවය කරන කාර්මික ශිල්පීන් සමග පැවති සාකච්ඡාවක දී යන්ත්‍ර ක්‍රියාවිරහිත වීම අවම කිරීම සඳහා අවශ්‍ය උපදෙස් ලබා දෙන ලදී. එහෙත් සති දෙකකට පසු කළ නිරීක්ෂණවල දී තවමත් යන්ත්‍ර ක්‍රියාවිරහිතවීම්වල අඩුවක් නොමැති බවත්, ඊට හේතුව කාර්මික ශිල්පීන් වැඩිදෙනෙකු හට තමා විසින් ලබාදුන් උපදෙස් අවබෝධ වී නොතිබීම බවත් ප්‍රධාන කාර්මික ශිල්පියාට අවබෝධ විය.
(අ) ප්‍රධාන කාර්මික ශිල්පියාගේ උපදෙස් සෙසු කාර්මික ශිල්පීන්ට අවබෝධ **නොවීමට** හේතු විය හැකි කරුණු මොනවා ද?
(ආ) "ලිඛිත සන්නිවේදනයට වඩා වාචික සන්නිවේදනය සඵලදායී සන්නිවේදන මාර්ගයක් වේ." ඔබ මෙම අදහසට එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 04 යි)

(iv) ඔබ පාසල් විවාද කණ්ඩායමේ සාමාජිකයකු යැ'යි ද, ඊළඟ සතියේ 'රටක් භාණ්ඩ ආනයනය කළ යුතු ය' යන මාතෘකාව යටතේ පැවැත්වෙන විවාදයකට ඔබ කණ්ඩායම සහභාගි වීමට ඇතැයි ද උපකල්පනය කරන්න.
(අ) ඉහත මාතෘකාවට පක්ෂ ව කරුණු **හතරක්** ලියන්න.
(ආ) ඉහත මාතෘකාවට ප්‍රතිපක්ෂ ව කරුණු **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)

(v) (අ) ශ්‍රී ලංකාවේ නාගරික ප්‍රදේශ තුළ සුපිරි වෙළෙඳසැල් සංඛ්‍යාවේ සැලකිය යුතු වැඩිවීමක් දක්නට ලැබේ. සුපිරි වෙළෙඳසැල්වලින් පාරිභෝගිකයින්ට ලැබෙන වාසි **හතරක්** ලියන්න.
(ආ) පාරිභෝගිකයින් තවමත් ව්‍යාපාර ගනුදෙනු සඳහා විද්‍යුත් මාධ්‍ය යොදාගැනීමට පසුබට වන බවක් දක්නට ලැබේ. මෙම පසුබට වීමට හේතු විය හැකි කරුණු **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)
(මුළු ලකුණු 20 යි)

[ තුන්වෙනි පිටුව බලන්න.

## II කොටස

**5.** (i) (අ) සංවිධානයක කාර්යක්ෂමතාව හා සඵලදායීතාව මැනීමට යොදාගත හැකි නිර්ණායක මොනවා ද?

(ආ) වර්තමානයේ දී කළමනාකරණය පෙරට වඩා වැදගත් වීමට හේතු විය හැකි කරුණු **හතරක්** ලියන්න. (ලකුණු 04 යි)


(ii) ව්‍යාපාර පරිසරයේ ඇති අවිනිශ්චිතභාවය නිසා එක් ව්‍යාපාරිකයකු විසින් සැලසුම් කිරීම යන්න මුදල් හා කාලය නාස්ති කිරීමක් බවට විශ්වාස කරයි.

(අ) එම ව්‍යාපාරිකයා හට සැලසුම්කරණයෙහි වැදගත්කම වටහා දීම සඳහා සැලසුම්කරණයේ ඇති වාසි පැහැදිලි කරන්න.


(ආ) තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී ප්‍රශස්ථ විකල්පය තෝරා ගැනීම සඳහා භාවිත කළ හැකි නිර්ණායක මොනවා ද? (ලකුණු 04 යි)

(iii) A හා B සමාගම් දෙකෙහි සංවිධාන සටහන් පහත පරිදි වේ.

A




B




සංවිධානකරණ මූලධර්ම පදනම් කරගනිමින්, ඉහත සඳහන් A හා B සමාගම්වල සංවිධාන සටහන් දෙකෙහි සමානතා හා අසමානතා විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) ඉහළ කළමනාකරුවන් සඳහා වඩාත් වැදගත් වන කළමනාකරණ කුසලතාව කුමක් ද? හේතු දක්වන්න.

(ආ) ආයතන විසින් තම සේවක අභිප්‍රේරණය සඳහා රුපියල් මිලියන ගණනින් මුදල් වියදම් කරනු ලැබේ. අභිප්‍රේරණය වූ සේවකයින්ගෙන් කළමනාකරණයට ලැබෙන ප්‍රතිලාභ මොනවා ද? (ලකුණු 04 යි)

(v) සේවක අභිමුඛ නායකයින් සේවකයින් සතුටෙන් තබාගන්නා අතර ම ඔවුන්ගෙන් තම කාර්යය ද ඉටුකරවා ගනු ලැබේ.

(අ) සේවක අභිමුඛ නායකත්වය යනු කුමක් දැ'යි නිර්වචනය කරන්න.

(ආ) සඵලදායී නායකයකුගේ ගති ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

**6.** (i) (අ) ආරක්ෂිත තොගය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

(ආ) JIT ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ දී, ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ආයතන මුහුණ දෙන බාධක කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(ii) හුවමාරු සම්බන්ධතා සංකල්පය මත (Exchange relationship) වෙළෙඳපොළ නැමැති සංකල්පය ගොඩනැගී ඇත.

(අ) හුවමාරු සම්බන්ධතාවක් ගොඩනැගීම සඳහා සපුරාලිය යුතු අවශ්‍යතා මොනවා ද?

(ආ) විවිධ වර්ගයේ පාරිභෝගිකයන් කවුරුන් දැ'යි උදාහරණ සහිත ව නම් කරන්න. (ලකුණු 04 යි)

(iii) පහත සඳහන් සංකල්ප යුගල අතර වෙනස්කම් පැහැදිලි කරන්න.

(අ) පවුල් සන්නම හා පුද්ගලික සන්නම

(ආ) කළමනාකරණ තොරතුරු පද්ධතිය හා අලෙවිකරණ තොරතුරු පද්ධතිය (ලකුණු 04 යි)

(iv) ව්‍යාපාර ආයතනයකට අදාළ තොරතුරු පහත පරිදි වේ.

- මුළු සේවක සංඛ්‍යාව 100
- සතියකට මුළු සේවක ගෙවීම් (රු.) 4 000
- සතියක මුළු නිමැවුම් (ඒකක) 50 000

පහත දෑ ගණනය කරන්න.

(අ) ඒකකයකට ශ්‍රම වියදම

(ආ) ශ්‍රම ඵලදායිතාව (ලකුණු 04 යි)

(v) ප්‍රවර්ධන මිශ්‍රයේ අඩංගු උපාංග කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

[ හතරවෙනි පිටුව බලන්න.

7. (i) ණය කාඩ්පත් භාවිත කරමින් භාණ්ඩ මිල දී ගන්නා පාරිභෝගිකයින්ට වට්ටම් ලබාදෙන බවට සුපිරි වෙළෙඳසැලක් විසින් දැනුම් දී ඇත.
   (අ) ණය කාඩ්පත් භාවිතයේ වාසි හා සීමා පැහැදිලි කරන්න.
   (ආ) ශ්‍රී ලංකාවේ භාවිත වන ණය කාඩ්පත් සඳහා උදාහරණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(ii) කොළඹ ව්‍යාපාර වස්තු හුවමාරුවේ සුරැකුම්පත් ගනුදෙනුවන ක්‍රම **දෙක** නම් කර, ඉන් එක් ක්‍රමයක් විස්තර කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) කාර්මික ආරවුල් ඇති වීමට බලපාන මූලික හේතු **දෙකක්** සඳහන් කරන්න.
   (ආ) වෘත්තීය ක්‍රියාමාර්ගයක් සමථයකට පත් කිරීම සඳහා ශ්‍රී ලංකාවේ ව්‍යාපාර ආයතනවලට අනුගමනය කළ හැකි විවිධ ක්‍රමවේද කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) (අ) මානව සම්පත් සැලසුම් කිරීම මගින් සංවිධානයකට ලැබිය හැකි වාසි **හතරක්** සඳහන් කරන්න.
   (ආ) කාර්ය සාධන ඇගයීම තුළින් සේවකයන් හට ලබාගත හැකි වාසි මොනවා ද? (ලකුණු 04 යි)

(v) බොහෝ පර්යේෂකයින්ට අනුව ඇඟලුම් කර්මාන්තයෙහි උද්ගතව ඇති ප්‍රධාන ගැටලුවක් වන්නේ ඉහළ සේවක පිරිවැටුම ය. මෙම ගැටලුව නිරාකරණය කර ගැනීමට ගත හැකි පිළියම් **හතරක්** යෝජනා කරන්න. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

8. (i) (අ) දත්ත සැකසුම් ක්‍රියාවලියක (Data Processing) ප්‍රධාන කාර්යයන් විස්තර කරන්න.
   (ආ) ව්‍යාපාර වර්ධනය සඳහා සමාජ ජාල (Social Network) යොදා ගත හැකි ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(ii) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ දියුණුව ව්‍යාපාර කටයුතු කෙරෙහි බලපාන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iii) (අ) සමච්ඡේදන ලක්ෂ්‍යය (Break even point) යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
   (ආ) ව්‍යවසායකයකු වන ලක්මාල් ඔහුගේ නිෂ්පාදන සම්බන්ධ පහත තොරතුරු ඉදිරිපත් කර ඇත.

| | | |
|---|---|---|
| • නිෂ්පාදනය කළ සමස්ත භාණ්ඩ ප්‍රමාණය | (ඒකක) | 10 000 |
| • ඇස්තමේන්තු කළ විකුණුම් වටිනාකම | (රු.) | 1 000 000 |
| • විචල්‍ය පිරිවැය | (රු.) | 600 000 |
| • ස්ථාවර පිරිවැය | (රු.) | 200 000 |

ඉහත තොරතුරු පදනම් කරගෙන පහත සඳහන්.දෑ ගණනය කරන්න.

1. ලාභය
2. දායකය
3. සමච්ඡේදන ලක්ෂ්‍යය

(ලකුණු 04 යි)

(iv) ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික පරිවර්තනයන් සඳහා සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල (SME) වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(v) පහත සඳහන් වගුව ආශ්‍රයෙන් ව්‍යාපාර සැලැස්මක අඩංගු විය යුතු අංග දෙකක් වන විධායක සාරාංශය හා මෙහෙයුම් සැලැස්ම පැහැදිලි කරන්න.

| ව්‍යාපාර සැලැස්මක අංග | විස්තරය | අන්තර්ගත එක් කරුණක් |
|---|---|---|
| 1. විධායක සාරාංශය | | |
| 2. මෙහෙයුම් සැලැස්ම | | |

(ලකුණු 04 යි)

(මුළු ලකුණු 20 යි)

* * *